<u>නියාගම ප්‍රාදේශීය සභාව</u>
<u>ගාල්ල දිස්ත්‍රික්කය</u>

## 1. මූල්‍ය ප්‍රකාශන
----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 01 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 22 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට නියාගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

#### 1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම
-----------------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.3 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික පළාත් පාලන සේවකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් රු.2,423,098 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) 1999 මැයි 07 දින සභාව විසින් මිලදී ගෙන තිබූ රු.182,000 ක් වූ අංක 67-2998 දරන ට්‍රැක්ටර් ට්‍රේලරය සහ මධ්‍යම පරිසර අධිකාරිය මගින් 2010 වර්ෂයේ දී සභාවට ලබා දී තිබූ රු.1,499,800 ක් වූ ට්‍රැක්ටරය හා ට්‍රේලරය මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිවිසුම්ගත නොවූ කර්මාන්ත දෙකක් වූ මාර්තුපිටිය වැල් පාලම සහ මත්තක අත්කොටුව පාලම ඉදිකිරීමේ කර්මාන්ත සඳහා පිළිවෙලින් රු.483,055 ක් සහ රු.574,957 ක් ද වශයෙන් එකතුව රු.1,058,012 ක් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා තිබීමෙන් වර්ෂයේ වියදම හා ණයහිමියන් රු.1,058,012 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) රු.66,950 ක ස්ථාවර වත්කම් මිලදී ගැනීම් මූල්‍ය ප්‍රකාශනවල පුනරාවර්තන වියදම් ලෙස දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට 2013 මහ නැගුම ව්‍යාපෘතිය යටතේ කර්මාන්ත 29 ක් වෙනුවෙන් ලැබිය යුතු මුදල රු.14,500,000 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.21,805,528 ක් ලෙස දක්වා තිබීමෙන් ණයගැතියෝ සහ මූලධන ආධාර රු.7,305,528 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයන්හිදී ප්‍රතිපාදන සලසා තිබූ රු.1,097,618 ක ණයහිමියන් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ද ප්‍රතිපාදන සලසා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ණයහිමියන් රු.1,097,618 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වැටුප් ප්‍රතිපූර්ණය ලෙස දකුණු පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු රු.9,679,260 ක් සියළු වැඩ සටහන් අතර විභජනය නොකර, එක් වැඩ සටහනක් යටතේ දක්වා තිබුණි.

(ඌ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ පිටිගල සතිපොළ හා බහු කාර්යය පරිශ්‍රය ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මූලධන ආධාර මුදල් රු.12,423,065 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.12,884,671 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූලධන ආධාර හා ණයගැතියන් රු.461,606 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් නිශ්චිත සංවර්ධන සැලැස්ම යටතේ ලැබිය යුතු මූලධන ආධාර රු.1,200,000 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.2,141,010 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූලධන ආධාර හා ණයගැතියන් රු.941,010 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) කර්මාන්ත සඳහා ප්‍රතිපාදන අනුමත වී නොතිබිය දී මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.3,304,221 ක් කර්මාන්ත ණයගැතියන් ලෙස ප්‍රතිපාදන සලසා තිබුණි.

(ඔ) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය ප්‍රතිපාදන යටතේ පිටිගල සතිපොළ හා බහු කාර්යය පරිශ්‍රය ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණයහිමි ශේෂය රු.15,000,000 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.12,884,671 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූලධන වියදම් හා ණයහිමියන් රු.2,115,329 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ රු.4,032,466 ක් වූ ආදායම් බිල් කිරීමේදී ඒ සඳහා ජර්නල් සටහන් භාවිතා කර නොතිබුණි.

**1.3.4 නොසැසඳු පාලන ගිණුම්**

----------------------------

ගිණුම් විෂයයන් 04 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.235,514 ක වෙනසක් නිරික්ෂණය විය.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.139,476,281 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා, විධිමත්ව පවත්වාගෙන යනු ලබන ණයහිමි / ණයගැති ලේඛන, කාල විශ්ලේෂණ, ශේෂ සනාථ සහතික සහ ණය ලේඛනය ආදි සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 832,556 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,083,163 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

----------------------

**2.2.1 වරිපනම් බදු, අක්කර බදු හා සතිපොල බදු**

----------------------------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාලව අයකර ගත යුතුව තිබූ රු.338,618 ක් වූ වරිපනම් බදු, රු.69,237 ක් වූ අක්කර බදු හා රු.50,543 ක් වූ සතිපොල බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 වෙළඳ බලපත්‍ර ගාස්තු**

-----------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාලව සභාව විසින් අයකර ගත යුතුව තිබූ රු.126,000 ක් වූ වෙළඳ බලපත්‍ර ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.1,216,750 ක උසාවි දඩ හා රු.4,368,394 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

**2.3 අධිභාර**

---------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිවයුතු පුද්ගලයින්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන් තුළ පනවන ලද අධිභාර **09** ක් සම්බන්ධයෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු.432,927 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව සභිකයින් 04 දෙනෙකු විසින් සමාලෝචිත වර්ෂය සඳහා වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** සභාවේ සේවකයින් 21 දෙනෙකු වෙත සභා අරමුදලින් ගෙවා තිබූ රු.1,581,995 ක හිඟ වැටුප් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

**(ආ)** සභාවේ සේවය කර ස්ථාන මාරු වී ගිය සහ විශ්‍රාම ගිය සේවකයන් 05 දෙනෙකුගෙන් අයකර ගත යුතුව තිබූ රු.16,901 ක ණය ශේෂයක් 2006 වර්ෂයේ සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 නිශ්ක්‍රීය වත්කම්**

2013 ජුනි 05 දිනැති අංක: PCMD/PR/2013 දරන ජනාධිපති ලේකම්වරයාගේ චක්‍රලේඛය පරිදි රජයේ ආයතන තුළ ප්‍රයෝජනයට නොගෙන විනාශ වෙමින් පවතින පැරණි වාහන හා යන්ත්‍රෝපකරණ 2013 සැප්තැම්බර් 05 දින වනවිට අපහරණය කිරීමට වැඩපිළිවෙලක් සකස් කරන ලෙසට දන්වා තිබුණ ද, සභාව සතු ට්‍රැක්ටරයක්, ට්‍රේලරයක් හා කැබ් රථයක් සභා භූමියේ දිරාපත් වෙමින් පවතින බව 2014 ඔක්තෝබර් 23 දින සිදු කරන ලද විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

3.4 අවිධිමත් ගනුදෙනු

(අ) ජනාධිපති ලේකම්වරයාගේ 2014 මාර්තු 21 දිනැති අංක :සීඑස්ජ්/1/8/1/1 දරන චක්‍රලේඛයට 2014 මැයි 25 දිනෙන් යුතුව ඉදිරිපත් කරන ලද සංශෝධිත චක්‍රලේඛයට අනුව පළාත් පාලන ආයතනවල අරමුදල් යොදා ගනිමින් සංවිධානය කරනු ලබන විදේශ අධ්‍යයන චාරිකා නැවත උපදෙස් දෙන තුරු අත්හිටුවා තිබුණි. එකී විධිවිධාන වලට පටහැනිව 2014 ජුනි 29 දින සිට ජූලි 04 දින දක්වා චීනයේ පැවැත්වෙන පළාත් පාලන ක්‍රම සහ යහපුරුදු පිළිබඳ අධ්‍යයන චාරිකාවක් සඳහා සභාපතිවරයා සහභාගීවීම වෙනුවෙන් 2014 මැයි මාසයේදි රු.160,000 ක් ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය වෙත ගෙවා තිබුණි.

**(ආ)** 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියේ දැක්වෙන විධිවිධාන වලට පටහැනිව සභාපති, උප සභාපති ඇතුළු සභා මන්ත්‍රීවරුන්ගේ අධ්‍යයන චාරිකාවක් සඳහා සභා අරමුදලින් 2013 සැප්තැම්බර් 25 දින රු.100,000 ක් ගෙවා තිබුණි.

**4. පද්ධති හා පාලනය**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය